70 දශකය සංගීතවත් කළ
ධර්මරත්න සහෝදරයෝ

Image 1 - Sweety Dharmaratne (Sister of Dharmaratne Brothers) Image 2 - L to R: Ronald, Melroy, Stella, Maxwell,

ඔක්තෝබර් 21 වන දා රිවර්ගම් තියටර් හිදී 70 දශකයේ සිංහල කණ්ඩායම් සංගීත ක්ෂෙත්‍රය ඔපවත් කළ ධර්මරත්න සහෝදරයන් පිළිබඳ මතකය නැවත අලුත් කරගන්නට මෙල්බර්න් සංගීත රසිකයනට අවස්ථාව ලැබෙයි.

ධර්මරත්න සහෝදරයෝ සංගීත කන්ඩායම ආරම්භ වන්නේ 1968 වසරේ දී ය. ආරම්භක සාමාජිකයන් වූයේ ක්‍රිස්ටි ධර්මරත්න, මැක්ස්වෙල් ධර්මරත්න, මෙල්රෝයි ධර්මරත්න සහ රොනල්ඩ් ධර්මරත්න යි.

වැස්ස වහිනවා, පුංචි හුරතලා, කඳුකරේ, යනාදී ගී පද ඇසෙන සැනින් දැස මානයේ මැවෙන තරුණයන් සිව් දෙනෙකි. කිසිදු චිකිතයකින් තොරව ගී ගයන ඔවුන් දෙස ප්‍රේක්ෂකයන් බලා හිඳින්නේ ඉමහත් සෙනෙහසකිනි. මේ ධර්මරත්න සොහොයුරෝය. නමින් කියවෙන්නාක් මෙන් සැබවින්ම එකම ලෙයින් උපන් සෙනෙහෙබර සොහොයුරෝ වෙති.

කොළඹ කොටහේන ප්‍රදේශයේ පිහිටි නිවසකි. මව ස්ටෙලා මිහිරි ලෙස හාමොනිකාව වයන්නිය. කුඩා දරුවෝ සිව් දෙනා ඒ දෙස අවධානයෙන් බලා සිටිති. පසු කලෙක මව දමා දුන් ඒ අඩිතාලම මත ධර්මරත්න සහෝදරයෝ නම් වූ අපූර්ව සංගීත කණ්ඩායම ගොඩනගන ඔවුන්ට කණ්ඩායමේ කළමනාකාරිත්ව ලෙස තවදුරටත් සෙනෙහෙබර මවගේ නොමඳ සහය හිමිවිය.

ලාබාලතම සොහොයුරන් වූ මෙල්රොයි හා රොනල්ඩ් ධර්මරත්න සහෝදරයෝ යන නමින් ඉදිරිපත් කිරීම අරඹන්නේ පාසල් වියේදීමය. පසුව මැක්ස්වෙල් හා ක්‍රිස්ටි ද ඔවුන්ට එක් වූ අතර ධර්මරත්න සහෝදරයෝ කලඑළි බසින්නේ විවාහ උත්සව ආදී පවුලේ විවිධ උත්සව අවස්ථාවල ගී ගයමිනි.

මුල් කාලයේදී එවකට ජනප්‍රිය ගායකයන් වූ ක්‍රිස්ටෝපර් පෝල්, වින්සන් ද පෝල්, සුනිල් ශාන්ත වැන්නවුන්ගේ ගී ගැයුවද කල්යත්ම ස්වකීය නිර්මාණ ගොන්නක්ම රසික රසිකාවියන්ට තිළිණ කළ අතර සංගීත කණ්ඩායම් රැසක් සහභාගි වූ තරගයකින් දෙවන ස්ථානය දිනා ගැනීමත් සමගම ජාතික ගුවන් විදුලිය හරහා කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ හා ලන්තෑරුම් එල්ලෙන්නේ යන ගී ද්විත්වය පටිගත කිරීමේ අවස්ථාව දිනා ගත්තෝය.

මෙලෙසින් ලංකාවේ ප්‍රථම පවුලේ පොප් සංගීත කණ්ඩායමේ ආරම්භය සනිටුහන් විය.

ඔවුන්ගේ ප්‍රථම වේදිකා ඉදිරිපත් කිරීම ශාන්ත බ්‍රිප්ටි කන්‍යාරාමයේ පැවති ආසිරි කුසුම් ය. එය සංවිධානය කරන ලද්දේ ලා සිලෝනියන්ස් හි නොයෙල් රණසිංහ සමග මැක්ස්වෙල් ධර්මරත්නය.

songs of lanka club" කණ්ඩායම් විවිධ අංග ඉදිරිපත් කළ ආසිරි කුසුම් හී අන් සියළු කණ්ඩායම් බොක්ස් ගිටාරය හා කොංගෝ ඩ්‍රම් වාදනය කල අතර ධර්මරත්න සහෝදරයෝ පමණක් කොංගෝව හැරුණු විට රබානද වැයූවෝය. මෙහිදී ඔවුන් පළ කළ දක්ෂතාවෙන් පැහැදීමට පත්වූ පැටිරික් කුරෙරා පිලිප්ස් ලේබලය යටතේ පටිගත කිරීම් සිදු කිරීමට අවස්ථාව ලබා දීමට එකඟ විය.

වර්ෂ 1968 සිය ප්‍රථම ඊ පී පටිගත කිරීම වේ. පුංචි හුරතලා, කඳුකරේ, නොන්ඩ් කිරා යනාදී ගීත හරහා එක රැයින් මෙරට ජනතාව අතර ජනප්‍රිය වූ ධර්මරත්න සහෝ දරයෝ ගැයූ මේ සුමිහිරි ගීත ගීත දශකවල ඔවුන් ඉහළටම ඔසවා තැබීමට හේතු විය.

---

33 පිටෙන්

වූ අකලංක නම් වන සල්ලිකාර සෙල්ලක්කාර තරුණයා පිළිබ. සියුම් කෝපයක් ඇගේ සිතේ ඇතිවෙයි. ඔහු උන්හිටි ගමන් භූතයකු සේ පැමිණ තමන් ගොඩ නගමින් තිබූ සිහින විමානය විනාශ කර දැමූ බව සිහිවන විට ඒ කෝපය වඩාත් වැඩි වෙයි. සල්ලිකාරයන්ගේ සෙල්ලක්කාරකම් වලට තමා ගොදුරක් වූ අසාධාරණ ආකාරය ඇගේ සිත පීඩාවට පත්කළේ ය. ඒ පීඩාවෙන් සිටි ඇයට නින්ද ගියේ රාත්‍රියේ තුන්වන යාමයේදිය.

ඒ උදෑසන ඉසුර ඇය සොයා ආවේ දිනපතා පුවත්පතක්ද අතැතිව ය.

"ඔයා නොකිව්වට මට තේරුණා නංගි මොකක්ද හරි කරදරයක් කියලා" ඔහු පුවත්පත ඇය අතට දෙන අතරේ කීවේ ය. "මේ පත්තරේ ඔයාගෙ නම නොතිබ්බට කියන්නෙ ඔයා ගැන තමයි"

ස්නේහා පුවත්පත අතට ගත්තේ ගැහෙන හදිනි.

"ආරක්ෂක නිලධාරියකුට සිහි නැතිවන්නට පහරදී රෝහලක සැඟවගත් සල්ලිකාර පුත්‍රයා පිළිබඳව අප පුවත්පතට තොරතුරු දුන්නැයි සැක කර එම රෝහලේ හෙදියකගේ වැඩ තහනම් කර ඇති බව වාර්තා වෙයි."

තවත් මොන මොනවාදෝ දිගින් දිගටම ලියා තිබුණ නමුත් ස්නේහා දුටුවේ එම වැකිය පමණකි. ඇය ඉතිරිය නොකියවාම පුවත්පත ඉසුර අතට දුන්නේ ය.

"කවුද මේ මිනිහා? ඔයාද පත්තරේට නිව්ස් එක දුන්නෙ?" ඔහු ප්‍රශ්න දෙකක්ම ඇසුවේ ය.

"මං ඔය කිසි දෙයක් දන්නෑ අයියා.." ස්නේහා මිමිණුවා ය. "මේ මිනිස්සුන්ට පිස-"සු.."

"පිස්සු නෙවෙයි.. සල්ලි බලේ.. පහත් තැනින් තමයි වතුර බහින්නෙ.. ඒකයි මෙහෙම දේවල් වෙන්නෙ.." ඔහු කීවේ ය. ".. මාමා දන්නෑ නේද?" ඔහු දෙවෙනුව ඇසුවේ ය.

"තාත්තට තේරෙනව ඇති මොකක් හරි අවුලක් කියලා.. මගෙන් ඇහුවෙ නැතුවට.."

"ඔයා ඕව ගණන් ගන්න එපා.. අපි එන විදිහකට මොකක් හරි බලමු .." ඔහු කීවේ ටික වේලාවක් කල්පනා කරමිනි සිටිමෙන් අනතුරුවය.

"මේක ඉක්මණට විසඳෙයි.. මට ඉක්මණින් ආයෙ වැඩට එන්න කියයි.." ස්නේහා කීවා ය.

"ඉතින් ආයෙමත් එතනටම යනවද? .. අසාධාරණ විදිහට වැඩ තහනම් කරපු තැනටම..?"

"මේක වැඩ තහනමක්ම නෙවෙයි..... අනික ඒ මිනිස්සු එහෙම කළේ මොකක් හරි ලොකු බලපෑමක් නිසා.. නැතුව ඒ අය නරක නැහැ.. ඒගොල්ලොත් මේ ගැන කණගාටු වෙනවා.. එන්න කිව්වොත් මං ආයෙ යනවා අයියා.."

ඔහු කල්පනා කරමින් සිටියේ ය.

"මං ඔයා නං ඒ පැත්ත පලාතෙ යන්නෙ නැහැ" ඔහු පසුව කීවේ ය.

ස්නේහා සිනාසුණා ය.

"හොඳ වෙලාවට මං ඔයා නොවුණෙ" ඒ සිනාවෙන්ම ඈ කීවා ය.

මතුපිටින් සිනාසෙන්නට උත්සාහ කළ ද ස්නේහාගේ සිතේ තිබුණේ මහා බරකි. ඒ සමගම සියුම් කෝපයකි.

"හරි නම් ඉසුරයිය කියන විදිහට යන්නම වටින්නෙ නැහැ තමයි.."

එසේ සිතුවද ස්නේහා හෙදියක ලෙස කළ වෘත්තියට ආදරය කළා ය. එය රැකියාවකට වඩා සේවයක් ලෙස ඈ සැළකුවා ය. එනිසාම ඒ වෘත්තිය කෙරෙහි ඇගේ සිතේ තිබූ ගෞරවය ඉතා විශාල එකක් විය.

ස්නේහා ගමට පැමිණ දෙවන දිනයේ උදෑසන තේරුම් ගත නොහැකි සිදුවීමක් සිදුවිය. එදා ඇය උදෑසනම පන්සලට ගියේ පසුදා සංවිධානය කරන්නට නියමිතව තිබූ ශ්‍රමදානයට සම්බන්ධව යමක් කරන්නටය. ඒ රැස්වීම වරුවක් පමණ පැවැත්විණි. එක් එක් අයට කාර්යයන් පවරා දීමෙන් පසු රැස්වීම අවසන් වූයේ මද්දහනත් පසුවූ පසුවය. ස්නේහා ඉක්මණින් නිවසට ආවේ කුඩාවුන්ට කෑමට යමක් රත්කර දෙන්නටය.

"ඇයි ඉක්මණින් යන්නෙ? තව ටිකක් ඉඳලා යන්න" ඉසුර කීපවතාවක්ම කීවේ ය. එහෙත් ස්නේහාට ඕනෑව තිබුණේම ඉක්මණට ගෙදර යන්නටය.

"අපි හෙට හමුවෙනවනෙ අයියෙ" ස්නේහා ඔහුට කීවා ය.

ස්නේහා වත්තට ඇතුල්වන්නටක් පෙරම ලොකුමල්ලි ගේ කටහඬ ඇසුණි.

"මේ බලන්නකො අක්කා"

"මොකක්ද?"

"මේන් බලන්ඩ.. "

ගෙයි සාලයේ තරමක පෙට්ටි දෙකක් විය. කුඩාවුන් විසින් දැනටමත් විවෘත කර තිබූ පෙට්ටි දෙකේ ප්‍රසිද්ධ සුපිරි වෙළඳසැලක නම මුද්‍රණය කර තිබුණි.

"කොහෙන්ද මේ?" ස්නේහා ඇසුවේ විමතියෙනි.

"වෑන් එකකින් ඇවිත් බාලා ගියා.. මේ බලන්න... පෙට්ටි දෙකේම අක්කගෙ නම ලියලා තියෙනවා.."

එය සැබෑවකි. පෙට්ටි දෙකේම පැති වල ස්නේහාගේ නමත් ලිපිනයත් මුද්‍රණය කළ කඩදාසි අලවා තිබුණි. පෙට්ටි දෙකම පුරවා තිබුණේ සුපිරි වෙළඳසැලකින් ගත හැකි විවධාකාර වූ භාණ්ඩ වලිනි.

"පොල් විතරයි නැත්තෙ" පෙට්ටි දෙකේ බඩු ඉවත් කළ තාත්තා කීවේ ස්නේහා කිසිවක් සිතා ගත නොහැකිව බලා සිටියදී ය. " සමහරවිට දුවගෙ වැඩපළෙන් එවන්න ඇති"

මතු සම්බන්ධයි